# දැන්වීමයි

## මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය - 2019/2020

1. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයෙහි 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි ඔබ මහපොළ ශිෂ්‍යත්වලාභියෙක්ද යන්න මේ සමග ඇති නාම ලේඛනයෙන් පරීක්ෂා කර ගන්න.

2. ඔබ මහපොළ ශිෂ්‍යත්වලාභියෙක් නම් මහපොළ ශිෂ්‍යත්ව ලියාපදිංචි ආකෘති පත්‍රය www.mahapola.lk මහපොළ වෙබ් අඩවියට පිවිස ලබා ගත හැකිය.

3. ශිෂ්‍යත්වලාභියා විසින් එම වෙබ් අඩවියට පිවිස සිය ජාතික හැඳුනුම්පත් අංකය භාවිතා කර මහපොළ ශිෂ්‍යත්ව ආකෘති පත්‍රය බාගත කොට සම්පූර්ණ කරන ලද ලියාපදිංචි අයදුම්පත, සිය පෞද්ගලික බැංකු ගිණුමට අදාල පාස් පොතේ සහතික කරන ලද ඡායා පිටපතක්ද සමග සෘජුවම මාර්ගගත ක්‍රමයෙන් (online) මහපොළ ශිෂ්‍යත්ව අරමුදල වෙත යොමුකළ යුතුය.

4. ඉහත මාර්ගගත ක්‍රමය (online) මගින් යොමුකරන ලද මහපොළ ශිෂ්‍යත්ව ආකෘති පත්‍රයේ පිටපතක් ශිෂ්‍යත්වලාභියාගේ අත්සන සහිතව හා එසේ යොමු කරන ලද සිය පෞද්ගලික බැංකු ගිණුමට අදාල බැංකු පාස් පොතේ පැහැදිලි ඡායා පිටපතක්, සත්‍ය පිටපතක් බවට අදාල බැංකුව මගින් සහතික කරවාගෙන 2022.03.15 දිනට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අධ්‍යයන හා ශිෂ්‍ය සේවා, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය යන ලිපිනය වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. (පාස් පොතක් නැති ඉතිරිකිරීමේ ගිණුමක් ඇති සිසුන්, බැංකුවෙන් ලබා ගන්නා ලද බැංකු ගිණුම් අංකය, ජාතික හැඳුනුම්පත් අංකය සමග නම ඇතුලත් ලිපියක් අදාල බැංකුව මගින් සහතික කර එවිය යුතුය).

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
අධ්‍යයන හා ශිෂ්‍ය සේවා
ලේඛකාධිකාරී වෙනුවට
**2022.03.03**